(ආ) **පුහුණුවන්නන් බඳවා ගැනීම**

ඉහත (i) හා (ii) අවශ්‍යතා සහිත අයවලුන් පුහුණුවන්නන් ලෙස බඳවා ගැනේ. ස්ථිර ඖෂධ තාක්ෂණ ශිල්පී - නිෂ්පාදන ලෙස බඳවා ගැනීම සඳහා, SPMC ආයතනයේ පුහුණු ඖෂධ තාක්ෂණ ශිල්පී - නිෂ්පාදන ලෙස වසර 1 1/2 ආයතන අභ්‍යන්තර පුහුණු කාලයක (NVQ 5 මට්ටමට සමාන) පළපුරුද්ද සමග ලිඛිත පරීක්ෂණයකට මුහුණ දීම අත්‍යවශ්‍ය කරුණු වේ.

(ඇ) පුහුණුවන කාලය තුළදී දීමනාවක් ගෙවනු ලැබේ.

**සුදුසුකම් : (12) සිට (15) දක්වා තනතුරු සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන්**

SPMC ආයතනයේ සේවකයකු වශයෙන්, ප්‍රාථමික ගනයේ - නුපුහුණු, අර්ධ - පුහුණු, පුහුණු වර්ගීකරණයේ, දෙවරකට නොවැඩි වාර ගණනකදී, අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ, ගණිතය. විද්‍යාව හා ඉංග්‍රීසි විෂයයන් ඇතුළත්ව විෂයන් 04 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් සමත්ව, වෘත්තීය සුදුසුකම් සමග වසර 05 ක සතුටුදායක සේවාකාලයක් සම්පූර්ණ කර තිබීම.

**තනතුරු (12) සිට (15) දක්වා පොදු කරුණු**

- වැටුප් පරිමාණය :

  MA 2-1-2016 : රුපියල් 30,310/- - 10X300 - 7X350 - 4X495 - 20X660 - 50,940/-

  මූලික වැටුප වන රුපියල් 30,310/-, 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. (2018 සඳහා ආරම්භක වැටුප් තලය රුපියල් 24,030/- වන අතර, ගැලපුම් දීමනාව රු. 3,522/- වේ)
- වයස :

  අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය.

## 16. ඖෂධ නිමාකිරීමේ සහායක

**(PL2 - III ශ්‍රේණිය)**

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්**

(අ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන්, සිංහල / දෙමළ, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි විෂයයන් ඇතුළත්ව සම්මාන සාමාර්ථ 04 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටීම.

සහ

(ආ) ඖෂධ ඇසුරුම්කරණය පිළිබඳ (NVQ 2 හෝ 3 මට්ටමට සමාන) වසර එකක පුහුණුව.

**සුදුසුකකම් : (16) තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්කරුවන්**

(1) ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් ලබා තිබීම,

හෝ

(2) SPMC ආයතනයේ සේවකයකු වශයෙන් ප්‍රාථමික තලයේ - නුපුහුණු ඉහත අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම් සහිත ස්ථිර තනතුරක වසර පහක (05) අඛණ්ඩ සේවයේ නිරතව සිටීම.

**(16) තනතුර සඳහා පොදු කරුණු**

**වැටුප් පරිමාණය :**

PL - 2- 2016 : රුපියල් 25,750/- - 10X270 - 10X300 - 10X330 - 12X350 - 38,950/-

මූලික වැටුප වන රුපියල් 25,750/-, 2020.01.01 දින සිට ගෙවනු ලැබේ. (2018 සඳහා ආරම්භක වැටුප් තලය රුපියල් 20.414/- වන අතර ගැලපුම් දීමනාව රුපියල් 4,608/- වේ)

- වයස :

  අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය.

**සියලු තනතුරු සඳහා පොදු කොන්දේසි :**

- සෑම අයදුම්කරුවකුම -
  - (i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
  - (ii) තනතුරට අදාළ රාජකාරී මනා ලෙස ඉටු කිරීම සඳහාත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහාත් සුදුසු ශාරීරික හා මානසික මට්ටමක සිටිය යුතුය.
  - (iii) මනා චරිතයකින් යුක්ත විය යුතුය.
- මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අදාළ නොවේ.
- ඉහත වැටුප්වලට අමතරව, රජයේ අනුමත අනෙකුත් දීමානද ගෙවනු ලැබේ.
- බඳවා ගැනීමේ ක්‍රමවේදය - ලිඛිත තරගකාරී විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**ආන්තික ප්‍රතිලාභ :**

- පැමිණීමේ හා කාර්යසාධන දිරි දීමනා
- ලබා නොගත් වාර්ෂික හා වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූර්ණය කිරීම
- වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය හා වෛද්‍ය ප්‍රතිපූර්ණ යෝජනා ක්‍රමය
- සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේවකයා විසින් තම වැටුපෙන් 10% දායකත්වයක් ලබා දිය යුතු අතර, සංස්ථාව විසින් 15% දායකත්වයක් දරනු ඇත.
- තවද, සේවක භාර අරමුදල (ETF) සඳහා සංස්ථාව විසින් අමතර 3% ක දායකත්වයක් දරනු ඇත.
- 1983 අංක 12 දරන පාරිතෝෂික පනත හා 2016.04.25 දිනැති MSD චක්‍රලේඛය ප්‍රකාරව පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ.
- වෙනත් ආන්තික ප්‍රතිලාභද හිමිය.

**පොදු උපදෙස් :**

ජීව දත්ත, අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම්, ලබාගත් සේවා පුහුණුව, දැනට දරන තනතුර, වැටුප් තලය හා පරිමාණය, පෙර දැරූ තනතුරු, පෙර සේව්‍යයන් වෙතින් සේවය ආරම්භක හා හැරගිය දිනයන් ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් හා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව, ලියාපදිංචි තැපෑලෙන් SPMC ආයතනයේ සභාපති වෙත, මෙම දැන්වීම පළවී දින 10 ක් ඇතුළත ලැබීමට සැලැස්විය යුතුය. කරුණාකර අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළයුතු අතර, රාජ්‍ය සේවයේ ආයතනවල අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ. ප්‍රමාදවී ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**සභාපති,**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,**
**අංක. 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,**
**කඳවල වත්ත, රත්මලාන.**